www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 'ස්වාධීන' කොසෝවෝව: බටහිර කොලනියක ව්‍යුහයක්

## "Independent" Kosovo: Anatomy of a Western protectorate

**පෝල් මිචෙල් විසිනි**
**2008 මාර්තු 1**

*"මානවයන්ට අදාල සිද්ධිවල දී එක් ජන කොටසක් වෙනත් ජන කොටසක් සමග සම්බන්ධ කොට තිබෙන දේශපාලනික බන්ධනයන් බිඳ දැමීමට අත්‍යවශ්‍ය කෙරී, මිහිකතගේ බලයන්, ස්වභාව ධර්මයේ සහ සොබාදම් දෙවියාගේ නීති නියාමයන් විසින් ඔවුන්ට හිමිකොට දී තිබෙන වෙන් වෙන් හා සමාන තත්වයන් අත්පත් කරගැනීමට සහ මානව වර්ගයාගේ අදහස්වලට ශිෂ්ට සම්පන්න ගෞරවයක් හිමි කරදීමට සිදු වූ විටෙක, ඔවුන්ට වෙන්වීමට බල කල හේතු ඔවුන් විසින් ම ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය."*

ඉහත වාක්‍යය ද ඇතුලත් ව, 1776 ජූලි මස 4 දා දෙවන මහාද්වීපික සම්මේලනය එක්සත් ජනපද ස්වාධීනතා ප්‍රකාශනය නිකුත් කලේ ය. ඇමරිකානු ජනතාවට වෙන්වීමට බල කල හේතුව වූයේ, මහා බ්‍රිතාන්‍යයේ රජතුමා"පරමාධිපත්‍යධාරී කෲරතර පාලනයක් ස්ථාපනය කිරීමට" යත්න දැරීම බව එය ප්‍රකාශ කලේ ය.

2008 පෙබරවාරි 17 දා කොසෝවෝහි අගනුවර වන ප්‍රිස්ටිනා හි දී එම පලාතේ ව්‍යවස්ථාදායකය ද නිදහස ප්‍රකාශයට පත් කලේ ය. "සෑම මිනිසකු ම සමාන ලෙස මවනු ලැබ ඇත, ඔවුන්ගේ මැවුම්කරු විසින් ජීවිතය, නිදහස සහ සතුට සොයායාම ඇතුලත් අහිමි කල නො හැකි නිශ්චිත අයිතිවාසිකම් ඔවුන්ට හිමිකොට දී තිබේ" යනුවෙන් ලොව සොලවාලමින් ප්‍රකාශයට පත්කල එක්සත් ජනපද නිදහස් ප්‍රකාශනයෙන්, කොසෝවෝ ප්‍රකාශනය එතරම් වෙනස් විය නො හැක.

බටහිර බලයන්ට, ඔවුන්ගේ ආයතනවලට සහ නියෝජිතයන්ට දාසභාවයෙන් යුතුව ද එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහ යුරෝපා කොමිසමේ නිර්නාමික නිලධරයන්ට ආයාචනාත්මක ස්වරූපයේ භාෂාවෙන් ලියන ලද්දා වූ ද ලියවිල්ලක් මගින්, තම රටේ ඇති වන්නා වූ රාජ්‍යයේ ස්වභාවය විදේශීය නරපතියෙකු විසින් පාලනය කරනු ලබන කොලනියක් ලෙස කොසෝවෝ නායකයෝ ප්‍රශ්නයකින් තොරව පිලිගනිති. පසුගිය දසවසර පුරා අසල්වැසි බොස්නියාව පාලනය කරනු ලැබ තිබෙන ආකාරයට ම රටෙහි ආර්ථිකය, රාජ්‍ය වියදම්, සමාජ වැඩපිලිවෙලවල්, ආරක්ෂාව සහ වෙලඳම පිලිබඳ සියලු මූලික තීරන දිගටම රැඳී තිබෙනු ඇත්තේ නේටෝව, එක්සත් ජාතීන් සහ යුරෝපා කොමිසම වාඩිලාගත් පරිපාලනයක හස්තයෙහි ය.

දැන් කොසෝවෝ වනාහි "තම රට වැසියන්ගේ අභිලාෂයන් පිලිබිඹු කරන ස්වාධීන සහ ස්වෛරී රාජ්‍යයක්" යයි එක් වාක්‍යයක අපට කියනු ලැබේ. ඊලඟ වාක්‍යය වන්නේ "මෙය එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මාටි ආටිසාරිගේ සහ කොසෝවෝ රාජ්‍යය ස්ථාපනය කිරීම සඳහා වූ ඔහුගේ විස්තීර්න යෝජනාවල නිර්දේශයන් සමග මුලුමනින් ම අනුකූල වේ" යන්නයි. හිටපු ෆින්ලන්ත ජනාධිපතිවරයා වන ආටිසාරි "අධීක්ෂිත" ස්වාධීනත්වය සඳහා වූ ඔහුගේ සැලැස්ම 2007 මාර්තු මාසයේ දී ඉදිරපත් කල නමුත් එය ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස නිවැරදිව දැකගත් සර්බියාවේ සහ රුසියාවේ විරෝධයට එම සැලැස්ම බඳුන් විය. ආටිසාරිගේ සැලැස්ම හකුලා ගන්නා ලද්දේ වුව ත් ස්වාධීනත්වය සඳහා කාල සටහනක් සකස් කල එය වත්මන් නිදහස් ප්‍රකාශනයේ කොඳු නාරටිය ලෙස පවතී.

යන්තම් පරිච්ඡේද 27කින් පමනක් සමන්විත නිදහස් ප්‍රකාශනය තුල පහත දැක්වෙන අවස්ථා ද ඇතුලත්ව ආටිසාරිගේ නාමය අට වතාවක් පෙනී සිටී.

* ආටිසාරි සැලැස්මේ අඩංගු වන කොසෝවෝව වෙනුවෙන් කැපවීම මුලුමනනින් පිලිගන්නා අපි එමගින් ඉදිරි අවුරුදුවල දී කොසෝවෝවට මග පෙන්වීම සඳහා යෝජනා කෙරෙන රාමුව ද ඉත සිතින් පිලිගනිමු.

* ව්‍යවස්ථාව ආටිසාරි සැලැස්මේ සියලු අදාල මූලධර්ම අඩංගු කර ගනු ඇත.

* අප ආටිසාරි සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය අධීක්ෂනය කරීමට ජාත්‍යන්තර සිවිල් අධිකාරීන්ට ත් යුරෝපා සංගම් නායකත්වය යටතේ නීතිය ස්ථාපනය කිරීමේ කර්තව්‍යයකට ත් ආරාධනා කරන අපි ඔවුන් ඉත සිතින් පිලි ගනිමු.

* කොසෝවෝව තුල ජාත්‍යන්තර මිලිටරි මෙහෙයුම්වල නායකත්වයේ භූමිකාව දිගට ම තබා ගැනීමට ත් 1999 වසරේ 1244 වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාව සහ ආටිසාරි සැලැස්ම

යටතේ එයට පවරනු ලැබ ඇති වගකීම්, කොසෝවෝවේ ආයතන එම වගකීම් භාර ගැනීමට සමර්ථ වනතාක් කල් ක්‍රියාත්මක කිරීමට ත් උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයට ආරාධනා කොට සිටින අපි ඔවුන් ද ඉත සිතින් පිලිගනිමු.

* ආටිසාරි සැලැස්මේ අටවන ඇමුනුම මගින් දක්වා ඇති සීමා කොසෝවෝව තම දේශ සීමා ලෙස සලකනු ඇත.

ඒ හා ම පසුව අවසාන කොටසේ මෙසේ පුනරුච්චාරනය කරයි : "විශේෂයෙන් ම ආටිසාරි සැලැස්ම යටතේ කොසෝවෝවට පවරා ඇති කාර්යභාරයන් ද ඇතුලත්ව මෙම ප්‍රකාශනය තුල අඩංගු වන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීමට කොසෝවෝව නීතියෙන් බැඳී සිටින බව අපි පැහැදිලිව, සුවිශේෂීව සහ සදාකාලිකව මෙමගින් සපථ කොට සිටිමු."

ආරම්භයේ පටන් ම එහි වගන්ති 15 සහ ඇමුන්ම් 12 "කොසෝවෝවේ අනෙකුත් සියලු නෛතික බලයන් ඉක්මවා ප්‍රමුඛ වන" බව අවධාරනය කරන ආටිසාරි සැලැස්ම ඒවා "අනාගත ජාත්‍යන්තර මැදිහත්වීම්" මගින් බලාත්මක කරන්නේ කෙසේදැයි විස්තර කරයි. එහි අඩංගු බොහෝ අවශ්‍යතා එක්සත් ජාතීන්ගේ කොසොවෝ මෙහෙවර (අන්මික්) තන්ත්‍රය යටතේ දැනටම ත් සැපිරී ඇති අතර ලියවිල්ල කරන්නේ හුදෙක් ඒවා රූපිකව ඉදිරිපත් කිරීම පමනි.

කොසෝවෝහි ජනයාගේ නව "ස්වාධීන" රට "නිදහස් තරඟ සහිත විවෘත වෙලඳපොල ආර්ථිකයක්" සතුවනු ඇති බව ත් එම රට "යුරෝපා කොමිසම සමගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සමීප සහයෝගයෙන් මූල්‍ය නිරීක්ෂන යාන්ත්‍රනයක් ස්ථාපනය කරනු ඇති" බව ත් සැලැස්ම කොසෝවෝ ජනයාට කියා සිටී.

කොසෝවෝ ආර්ථිකය මත ජාත්‍යන්තර ප්‍රාග්ධනය ආධිපත්‍යය දරන්නේ කෙසේදැයි මෑත වාර්තා පෙන්වා දෙයි. 2006 වසර අවසානය වනවිට රටෙහි බැංකු 6ක් පැවතුනු අතර එයින් සමස්ත බැංකු වත්කම්වලින් සියයට 70කට වඩා පාලනය කරන බැංකු දෙක ම මුලුමනින් ම විදේශ අයිතියට යටත් වේ. රක්ෂනය ක්ෂේත්‍රයේ කතාව ද ඊට සමාන එකකි. රක්ෂන සමාගම් නවයෙන් හයක් ම පවතින්නේ විදේශ හිමිකාරිත්වය යටතේ වන අතර එම සමාගම් හය රක්ෂන වත්කම්වලින් සියයට 70ක් කලමනාකරනය කරයි.

කොසෝවෝ භාරකාර ඒජන්සිය (කේටීඒ) යටතේ පවතින රාජ්‍ය සතු ව්‍යවසායයන් සහ සමාජය සතු ව්‍යවසායයන් තවදුර පෞද්ගලීකරනය කල යුතු යයි ද ආටිසාරි සැලැස්ම අනවා සිටී. අධ්‍යක්ෂක මන්ඩලයේ ජාත්‍යන්තර සාමාජිකයෝ කේටීඒ හි තීරන අත්හිටුවීමේ බලය සහිත වන අතර කේටීඒ වෙත වැඩියෙන් ම ආධාර කරන ජාත්‍යන්තර ආධාරකරුවන් දෙදෙනාට නිරීක්ෂකයන් ලෙස එහි රැස්වීම්වලට සහභාගී වීමේ හිමිකම ඇත.

කේටීඒ ය මේ වනවිට ත් ටිටෝ තන්ත්‍රය යටතේ සම්භව වූ රාජ්‍ය සතු ව්‍යවසායයන් සහ සමාජය සතු ව්‍යවසායයන් සිය ගනනත් විකුනා දමා ඇත.

2007 වසරේ ජූනි මාසය වනවිට සමාජ සන්තක ව්‍යවසායයන් 510ක් නව සමාගම් වෙත මාරු කොට තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාවලියක් හරහා ආයෝජකයන්ට විකුනා දමා තිබුනි. බොහෝ කම්කරුවන්ව එක්කෝ නෙරපා හැර හෝ නැතහොත් අවම සහනාධාරයක් පිලිගැනීමට බලකෙරී සිටි අතර සමස්ත ක්‍රියාදාමය ම දූෂන චෝදනා මඩ වගුරේ ගිලී තිබේ.

ආටිසාරි සැලැසම කොසෝවෝහි ආයතනවල ව්‍යුහය පිලිබඳව ද වට්ටෝරු සකස් කල අතර එම ආයතනවලින් බොහෝ ඒවා තුල "ජාත්‍යන්තර ප්‍රජාවේ" සාමාජිකයින් සිටිනු ඇත. ඇමතිවරු 12 දෙනෙකුගෙන් සමන්විත ආන්ඩුවේ වාර්ගික අනුපාතය අනුව බෙදී යන 120කගෙන් සමන්විත නියෝජිත මන්ත්‍රන සභාවක් අඩංගු වනු ඇත්තේ සුලුතර ජනගහනයේ බොහෝ දෙනා පලවා හරිනු ලැබ හෝ බැරැක්ක සහ කටු කම්බි පිටුපස ජීවත්වන තත්වයක් තුල යි. ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට සාමාජිකයින් 21 ක කොමිසමක් පත් කෙරෙන අතර යුරෝපා මානව හිමිකම් අධිකරනයේ සභාපති විසින් නම් කරනු ලබන විනිසුරුවරුන් තිදෙනෙකු ද ඇතුලත් විනිසුරුවන් නව දෙනෙකුගෙන් යුත් ව්‍යවස්ථාමය අධිකරනයක් පිහිටුවෙනු ඇත. කොසෝවෝ අධිකරන කවුන්සිලය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුනගෙන් දෙදෙනෙක් විනිසුරුවරුන් පත්කිරීම අධීක්ෂනය කරන "ජාත්‍යන්තර ප්‍රජාවේ" සාමාජිකයෝ ය. ස්ථාපනය කිරීමට නියමිත නව කොසෝවෝ ආරක්ෂක හමුදාවේ 2,500කට නො වැඩි සැහැල්ලු ලෙස සන්නද්ධ ක්‍රියාකාරී භටයන් ද 800ක විශේෂ භට පිරිසක් ද සිටිනු ඇති අතර ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය අර්බුදවලට ප්‍රතිචාර දැක්වීම, පුපුරන ආයුධ නිෂ්ක්‍රීය කිරීම සහ සිවිල් ආරක්ෂාවට සීමා කරනු ලැබ ඇත. කොසෝවෝව සිවිල් ගුවන් ගමන් ක්‍රියාකාරකම් පාලනය කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරියක් ද පිහිටුවනු ඇත.

කොසෝවෝහි ස්වාමියා ලෙස ක්‍රියා කරන්නේ යුරෝපීය විශේෂ නියෝජිත (ඊයූඑස්ආර්) ලෙස "තවත් තොප්පියක්" දමාගත් ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, යුරෝපා සංගමය, යුරෝපා කොමිසම, නේටෝව සහ රුසියාවෙන් සමන්විත ජාත්‍යන්තර මාර්ගෝපදේශක කන්ඩායමක් (අයිඑස්ජී) විසින් පත් කරනු ලබන ජාත්‍යන්තර සිවිල් නියෝජිතයෙකි (අයිසීආර්). අයිසීආර්ගේ කටයුතු කවර විටෙක කරනු ලබන්නේ ද යන්න තීරනය කිරීමේ පරම බලය පවතින්නේ අයිඑස්ජී සතුවයි. කොසෝවෝව නිදහස ප්‍රකාශ කිරීමට දින දෙකකට පෙර බොස්නියා-

හර්සගොවිනාවේ හිටපු නේටෝ දේශපාලන උපදේශකවරයෙක් වන පීටර් ෆීත් අයිසීආර්/ඊයූඑස්ආර් තනතුරට පත් කරන ලද අතර ඔහුගේ නියෝජ්‍ය තනතුරට ජර්මනියේ ලිප්සිග්හි හඅටපු එක්සත් ජනපද තානාපති ජනරාල් වන ෆ්ලෙචර් බර්ටන් ව පත් කරන ලදී.

කොසෝවෝහි අධිකාරීන් විසින් නිර්දේශ කරනු ලබන නීති අවලංගු කිරීම හා රාජ්‍ය නිලධාරීන්ගේ පත්වීම් අනුමත කිරීම සහ ඔවුන්ව ඉවත් කිරීම ඇතුලත්ව ආටිසාරි සැලැස්ම බලාත්මක කිරීමේ බලතල ජාත්‍යන්තර සිවිල් නියෝජිතයා සතු වේ. එයට අමතරව විගනකාධිපති, රේගු සේවා අධ්‍යක්ෂ ජනරාල්, බදු පරිපාලන අධ්‍යක්ෂ, භාන්ඩාගාර අධ්‍යක්ෂ සහ කොසෝවෝ මධ්‍යම බැංකු අධිකාරියේ කලමනාකාර අධ්‍යක්ෂ ඇතුලු සමහර රාජ්‍ය නිලධාරීන් පත්කිරීම ඍජුවම එම නියෝජිතයා විසින් කරනු ඇත. මෙම නියෝජිතයා සහතික කරන තෙක් රටෙහි නියෝජිත මන්ඩලය ව්‍යවස්ථාව නිල වසයෙන් අනුමත නො කරනු ඇත.

"නීතියේ පාලනයට අදාල සියලු අංශවලට අධීක්ෂනය, මග පෙන්වීම හා උපදෙස් දීම කිරීමට" යූලෙක්ස් දූත මෙහෙවෙර නමින් නිර්මානය කරනු ලබන යුරෝපීය ආරක්ෂක ප්‍රතිපත්ති මෙහෙවරක් සඳහා ද දැනට කොසෝවෝහි රැඳී සිටින 16,000ක් වන නේටෝ භටයන් ඇතුලත් කරගන්නා නේටෝ නීත ජාත්‍යන්තර මිලිටරි පෙනී සිටීමක් සඳහා ද ආටිසාරි සැලැස්ම කැඳවුම් කරයි. "අවශ්‍ය අවස්ථාවල දී කිසිදු වෙනත් අවසරයකින් හෝ මැදිහත්වීමකින් තොරව අවශ්‍ය බලය පාවිච්චි කිරීමට" මෙම මිලිටරි බලකායට බලය ඇත. සර්බි සුලුතරයට සහ ආගමික ස්මාරකවලට ආරක්ෂාව සම්පාදනය කිරීම ත් කොසෝවෝ ආරක්ෂක හමුදාව නිර්මානය කිරීම හා බොහෝ දුරට කොසෝවෝ විමුක්ති හමුදාවේ හිටපු සාමාජිකයින්ගෙන් සමන්විත ගිනි නිවන භටකායක් වන කොසෝවෝ ආරක්ෂක බලකාය විසුරුවා හැරීම අධීක්ෂනය කිරීම ත් එම මිලිටරි බලකායට පැවරේ. එසේම සිවිල් ගුවන් සේවා අධිකාරියේ කටයුතු අත්පත් කරගැනීමේ හා අවශ්‍ය වනවිටෙක ගුවන් කලාපයේ මිලිටරි පාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ හැකියාව නේටෝ මිලිටරි බලකායට සතු වනු ඇත.

නාගරික සභා, අධ්‍යාපන ආයතන සහ පොලිසියේ ව්‍යුහය හා බලතල අනවනු ලබන්නේ ද ආටිසාරි සැලැස්ම විසිනි. බාහිර නයවල කොසෝවෝහි කොටස ගෙවන ලෙස සැලැස්ම අනවා සිටින අතර එකඟතාවකට එලැඹීමට නො හැකි වුවහොත් ජාත්‍යන්තර මාර්ගෝපදේශක කන්ඩායම "පැහැර හැරිය නො හැකි නය කොටසක් ඇනවීමේ" බලය සහිත ජාත්‍යන්තර මැදිහත්කරුවකු නම් කරනු ඇත.

නිදහස කරා සාමකාමී සංක්‍රමනයකට ත් ආයෝජනවලට හා යුරෝපා සංගතමයේ සාමාජිකත්වය ලැබීමට සඳහා ස්ථාවර වටාපිටාවක් තිබීම සඳහා ත් මේ සියල්ල අවශ්‍ය බව කොසෝවේ හා බටහිර දේශපාලනඥයෝ සහ නිලධරයෝ ප්‍රකාශ කොට ඇත. එසේ වුව ද නව අයිසීආර්/ඊයූඑස්ආර් තනතුරට පත් වී සිටින ෆීත් එන්ආර්සී හැන්ඩල්ස්බ්ලැඩ් නමැති ලන්දේසි පුවත්පතට මෙසේ කීවේ යඃ " බලාපොරොත්තු ඉහල ය.... තම ජීවිතවල හා ආර්ථික කටයුතුවල ගුනාත්මකභාවය පිම්මේ ඉහල යනු ඇතැයි ජනයා අපේක්ෂා කරනවා." ඔහු අනතුරු අඟවා සිටියේ "යුරෝපා සංගමයට හෝ ඇමරිකාවට එම ජනයාගේ අපේක්ෂාවන් සපුරාලීමේ හැකියාවක් නැත."

"නිදහස අපේ වීදිවලට ඩොලර් ටොන් ගනන් ගෙන එනු ඇතිය යන මායාවෙන් අප අත්මිදිය යුතු යි.... ආර්ථික අර්බුදය නො කඩවා පැවතීමේ ඉඩකඩ තිබෙනවා. ලෝහ, ආහාර කර්මාන්ත සහ බලශක්ති අංශ ඇරඹීමට කාලය මෙන් ම සුවිශාල ආයෝජන අවශ්‍ය වෙනවා," යයි කොසෝවෝ ආර්ථික විද්‍යාඥ ඊබ්‍රාහිම් රෙක්ස්හෙපි එයට එකතු කලේ ය.

නිදහස් රටක් ලෙස තබා රටක් යන යෙදුම යොදා කොසෝවෝව හැඳින්වීම ම එම යෙදුම හාස්‍යයට ලක් කරයි. මිලියන දෙකකට ආසන්න ජනගහනයක් වාසය කරන කොසෝවෝ ප්‍රදේශය වර්ග කිලෝමීටර 10,887ක් හෙවත් වර්ග සැතපුම් 4,203ක් වසා ගනී. 2004 දී ඇස්තමේන්තු ගතකල පරිදි එක්සත් ජනපද ඩොලර් 2,328ක් ඒක පුද්ගල ආදායමක් සහිත එය යුරෝපයේ වඩාත් ම ඌන සංවර්ධිත ආර්ථිකයන්ගෙන් එකකි.

එක්සත් ජනපදයේ කොනෙක්ටිකට් ප්‍රාන්තය මෙයට වඩා ස්ථාවර රටක් වනු ඇත. විශාල ප්‍රදේශයක් සහිත එය ගොඩබිමින් ඈහිරී නොමැති අතර මිලියන 3.4ක් ජනගහනයක් සහිත ය. 2005 ඇස්තමේන්තුවට අනුව එක්සත් ජනපද ඩොලර් 47,819 ක ඒක පුද්ගල ආදායමක් එයට තිබුනු අතර එය කොසෝවෝහි එම අගයට වඩා විසි ගුනයකටත් වඩා වැඩි ය.

තම දේශ සීමාවෙන් පිටස්තරව කෙරෙන නිෂ්පාදනය මත කොෝවෝව මුලුමනින් ම පාහේ රැඳී සිටී. යුරෝපයේ අන් සියලු රටවලට වඩා අඩු එහි ඒක පුද්ගල අපනයනය යන්තම් යුරෝ මිලියන 77ක් පමනි. පුද්ගලික අංශයේ ක්‍රියාකාරකම්වල ඉහල යාමක් ගැන විශ්ලේෂකයෝ කියා සිටිය ද 2006 වසරේ නිවාසමය නො වන පුද්ගලික ආයෝජනය යුරෝ මිලියන 284ක් පමනක් වූ අතර අහක දමන ලෝහ ප්‍රකෘතිමත් කිරීමේ කර්මාන්තය මත රඳා සිටි අතර එය ජාත්‍යන්තර නිලධාරීන්ගේ සහ කොසෝවෝ ප්‍රභූ තන්ත්‍රයේ පරිභෝජන අවශ්‍යතා තෘප්තිමත් කිරීමට සන්ධි කරනු ලැබ තිබුනි.

අන්මික් වාඩිලාගැනීමේ වසර නවයක කාලසීමාවකට පසු කොසෝවෝ ජනගහනයේ අතිමහත් බහුතරයක් සඳහා දේවල් වර්ධනය වී ඇත්තේ ඉතා සුලුවෙන් වන අතර බොහෝ අංශවල දී තත්වය වඩාත් නරක් වී ඇත. 2003 වසරේ පටන් ජනගහනයෙන් සියයට 80 කට ආසන්න ප්‍රමානයක් ජීවන තත්වයන් කඩා වැටීමක් අත් දැක තිබේ. රටෙහි වැසියන්ගෙන් අඩකටත් වඩා වැඩි පිරිසක් රැකියා විරහිත වන අතරේ සැබෑ වැටුප් එකතැන පල් වේ. රැකියාවල නියුතු අයට මාසිකව ලැබෙන සාමන්‍ය අදායම යුරෝ 220 ක් හෙවත් ඇමරිකානු ඩොලර් 320 කි. ජනගහනයෙන් තුනෙන් පංගුවකට වැඩි පිරිසකගේ දෛනික අදාදායම යුරෝ 1.5ට අඩු ය. විශ්‍රාම වැටුප් හා වැටුප් ඉහල දමා ගැනීමේ ප්‍රයත්න වලකාලනු ලැබ තිබේ. පොහොසත් උදවිය විදේශයන්හි සේවයේ නියුතු ඥාතීන් එවන මුදල් මත රැඳී සිටී. දරිද්‍රතාවය කොතරම් පෘථුල පරිමාන හා සියලු දෙනා වෙලාගෙන ඇත්දැයි කිවහොත් තරමක් ව්‍යාජෝක්තිමය ලෙස පලාත් අතර අසමානතාව පවතින්නේ යුරෝපයේ අවම මට්ටමේ ය. එහෙත් ධනවත් ම සහ දුප්පත් ම අය අතර පරතරය වැඩිවෙමින් පවතී.

1999 න් පසුව ස්ථාපනය කරන ලද දේශපාලන පක්ෂවලට ඇති සහයෝගය විශාල ලෙස පහල යාමක් පෙන්නුම් කරමින් පසුගිය වසරේ පැවති මැතිවරනවල දී ඡන්දය පාවිච්චි කල ප්‍රමානය වාර්තාගත ලෙස පහල යාම -එය සියයට 43 ක් පමනක් වූ අතර කොසෝවෝ යුද්ධයෙන් ඉක්බිත්තේ පැවති මැතිවරනයේ දී සියයට 80 ක් ඡන්දය දුනි- පුදුමයට කරුනක් නො වේ.

1999 කරා ආපසු ගියහොත් විවිධාකාර ලිබරලුන්ගේ හා රැඩිකලුන්ගේ සහයෝගය සහිතව බටහිර බලයෝ කොසෝවෝ සඳහා ස්වයං-නීර්නය පිලිබඳ අවධාරනය කරමින් සර්බියාව මත නේටෝව යොදාගෙන බෝම්බ හෙලද්දී "සංහාරයෙන් ඉක්බිති- බෝල්කන් යුද්ධයේ දේශපාලන පාඩම්" යන ලිපිය තුල ලෝක සමාජවාදී වෙබ් අඩවිය අනතුරු ඇඟවූ පරිදි "යුගෝස්ලාවියාව මත බෝම්බ හෙලීම අධිරාජ්‍යවාදය හා කුඩා ජාතීන් අතර පවත්නා සැබෑ සබඳතා හෙලිදරවු කොට ඇත."

"විසිවන ශතවර්ෂයේ මුල් අවුරුදුවල හොබ්සන්, ලෙනින්, ලක්සම්බර්ග් හා හිල්ෆර්ඩිංගේ අධිරාජ්‍යවාදය පිලිබඳ මහා දෝෂාරෝපන වර්තමාන ලියවිලි ලෙස පෙනී යයි. ආර්ථිකව ගත්කල කුඩා ජාතීන් සිටින්නේ ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයන්ගේ නය දෙන ඒජන්සි සහ මූල්‍ය ආයතනවල අත් අඩංගුවේ ය. දේශපාලන ක්ෂේත්‍රයේ දී කුඩා ජාතීන් තම ස්වාධින අවශ්‍යතා අවධාරනය කිරීමට දරන ඕනෑම ප්‍රයත්නයක් ව්‍යසනකාරී මිලිටරි ප්‍රහාරයක තර්ජනය කැටුව එයි. වැඩිවන සංඛ්‍යාතයකින් කුඩා රාජ්‍යවලට තම ජාතික ස්වෛරීභාවය අහිමි කරනු ලබන අතර ඒවාට බලකරනු ලබන්නේ විදේශීය මිලිටරි ආක්‍රමන පිලිගැනීමට ත් සියලු අර්ථයන්ගෙන් යුතුව යටත් විජිත ස්වභාවයේ පාලන රූපාකාරවලට යටත් වන ලෙස ත් ය."

දශකයකට ආසන්න කාලයකට පසුව මෙම පෙර දැක්ම නිවැරදි බව සනාථ වී ඇත. කොසෝවෝව නිර්මානය කරනු ලැබ තිබෙන්නේ හුදෙක් සර්බියාවේ ජාතික ස්වෛරීභාවය පිලිබඳ කිසිදු සංකල්පයක් උල්ලංඝනය කරමින් පමනක් නො වේ; නිර්මානය කරනු ලැබ තිබෙන රාජ්‍යය ත් කිසිදු අර්ථයකින් ස්වෛරී ඒකකයක් ලෙස සැලකිය නො හැකි ය. ඇත්ත වසයෙන් ම කොසෝවෝව පාවිච්චි කරනු ලබන්නේ බෝල්කන් කලාපයේ ජනයාට ඔවුන්ගේ වාර්ගිකත්වය නො තකා ව්‍යසනකාරී විපාක ගෙන දෙන්නා වූ එක්සත් ජනපදය, යුරෝපය හා රුසියාව අතර පවත්නා මහා බල ප්‍රතිමල්ලවතා දාදු කෙලියේ ඉත්තකු ලෙස ය.

© www.wsws.org